**ලංකා පිඟන් සංස්ථාව - 2022**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ලංකා පිඟන් සංස්ථාවේ ''සංස්ථාව '' 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 7 හි 20 (ආ) වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදි මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට වර්ෂය තුල පාරිතෝෂික වශයෙන් වෙන් කළ මුදල රු.729,086 ක් ගැලපිය යුතු වුවත් රු.13,999,407 ක් ගලපා තිබීම හේතුවෙන් රු.13,270,321 ක් වැඩියෙන් දක්වා තිබුණි. | උපලේඛන හා ලෙජර් ගිණුම් සැසදීම අනුව නියමිත පරිදි ගිණුම් ගලපා ඉදිරියේදි නිවැරදි කරන බව. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 වගන්තිය ප්‍රකාරව දේපල , පිරියත හා උපකරණ අයිතමයන්හි ඵලදායි ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය වන විටද සංස්ථාව විසින් භාවිතා කරනු ලබන වත්කම් පන්ති 14කට අයත් ප්‍රධාන කාර්යාලයේ හා කම්හල් 8ක පවතින එකතු වටිනාකම රු.82,855,275 ක් වූ වත්කම් ඓතිහාසික පිරිවැයට ගිණුම්වල දක්වා තිබුණු අතර වත්කම්වල ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට | දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය ගණනය කර අදාල මූල්‍ය පුකාශනවල පෙන්විමට ආයතනයේ මූල්‍ය තත්වය යහපත් වූ විට සිදු කරන බව | වත්කම්වල ඵලදායී ජීව කාලය සමාලෝචනය කර නිවැරදි ධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුයි. |

කටයුතු කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 හි 36 වගන්තිය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම් අයත් වන දේපල පිරියත උපකරණ පන්තිය මුළුමනින් ප්‍රත්‍යාගණනය කළ යුතු වේ. කම්හල් තුනක රු.171,904,375ක් වූ ඉඩම් ප්‍රත්‍යාගණන වටිනාකමටත් කම්හල් හතරක රු.371,329 ක් වූ ඉඩම් පිරිවැයටත් ගිණුම්ගත කර තිබුණි. | ආයතනයේ පවතින මූල්‍ය තත්වයට අනුව කම්හල් 03 ක ප්‍රත්‍යාගණනය කටයුතු සිදු කර ගිණුම්ගත කර ඇති අතර,ඉතිරි කම්හල් ආයතනයේ මූල්‍ය තත්වය යහපත් වූ විට එකිනෙක සිදු කිරීමට කටයුතු කරන බව | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 20 ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශයෙන් ලද රු.1,000,000ක් වූ ප්‍රාග්ධන ප්‍රදානය ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් වලට අනුව සසදා බලා නිවැරදි වටිනාකම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව හා 2023 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රමිතිය ප්‍රකාරව ලියා හැරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එරගම කම්හල පිහිටි ඉඩමේ අක්කර 50 ක් බදු දීමෙන් ලද මුදල රු.1,800,000 ක් වූ අතර බදු ගිවිසුම් කාලය 2022 ජූලි 01 සිට 2023 ජුනි 30 විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළ අදායම රු.900,000 ක් වුවද, වෙනත් ආදායම් ලෙස රු.1,800,000 ක් ගිණුම් ගත කර තිබුණි. | 2023 ගිණුම් වර්ෂය තුලදි නිවැරදි වටිනාකම් ගිණුමෙහි ගැලපීමට කටයුතු කරන බව. | කාල පරිච්ඡේදයට අදාල ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට විගණනයේ ගණනය කිරීම් අනුව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු. 2,957,591 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 3,141,426 ලෙස හඳුනාගෙන ස්ථාවර තැන්පතු ආයෝජන ලෙස ගිණුම්ගත කර තිබුණි. එම හේතුවෙන් ලැබිය යුතු ආයෝජන පොළිය රු.2,957,591 ක් අඩුවෙන්ද, වෙනත් ආදායම් රු.183,835 ක් වැඩියෙන්ද, ස්ථාවර | 2023 ගිණුම් වර්ෂය තුලදි වැරදි නිවැරදි කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව . | අදාල ගණනය කිරීම් නිවැරදිව සිදු කර නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තැන්පතු ආයෝජන 3,141,426 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම රු.1,372,143 ක් වුවද රු.1,595,961 ක් ලෙස රු.223,818 ක් වැඩියෙන්ද වෙළෙඳ හා අනෙකුත් ණය හිමියන්ගේ වැඩිවීම රු.191,784 ක් වුවද, රු.700,739 ක් ලෙස රු.508,955 ක් වැඩියෙන් හා ගෙවන ලද පාරිතෝෂික මුදල රු.681,660 ක් වුවද, රු.725,630 ක් ලෙස රු.43,970 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුළ ස්ථාවර තැන්පතු හා පොළී වැඩිවීම රු.8,141,426 ක් වුවද, පොළී නැවත ආයෝජනය ලෙස රු.3,264,386 ක් පමණක් දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය රු.4,877,040 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් පරික්ෂා කර ඉදිරියේදි නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදි වටිනාකම් ඇතුලත් කරමින් සකස් කළ යුතුයි. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | දේපළ පිරියත හා උපකරණ | 155,992,714 | 153,750,018 | 2,242,696 | ස්ථාවර වත්කම් ලේඛන පරික්ෂා කර බලා අදාල නිවැරදි කිරීම් කිරිමට කටයුතු කරන බව. | අදාල නිවැරදි කිරිම් සිදු කර නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය | 10,336,101 | 10,112,282 | 223,819 | සටහන්වල පවතින ශේෂ පරික්ෂා කර ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ලබන බව. | -එම - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවීම් (කම්හල් අත්තිකාරම්) | 1,191,973 | 768,174 | 423,799 | ගිණුම් වලට අනුව සසදා බලා එම ලේඛන වටිනාකම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම - |
| (ඈ) | වෙළෙඳ හා වෙනත් ණයහිමියන් (නියෝජිත තැන්පතු) | 3,569,975 | 3,069,975 | 500,000 | ගිණුම් වලට අනුව සසදා බලා එම ලේඛන වටිනාකම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | -එම - |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)අයවිය යුතු වෙනත් තැන්පතු වටිනාකම රු.2,806,875 ක් වූ අතර, ඉන් වර්ෂ 3ක් ඉක්ම වූ කම්හල් තුනක ශේෂය | 1,278,224 | ශේෂය අයවියයුතු පාර්ශවයන් හෙළිදරව් කර නොතිබුණි. | මෙවැනි දෝෂ ඉදිරියේදි අවම කිරිම පිණිස කටයුතු සම්පාදනය කරබ බව | අදාල වටිනාකම් නිවැරදිව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ)වෙළඳ හා අනෙකුත් ණයහිමි රු.52,408,969 ක ශේෂයෙහි ඇතුළත් ආයතන දෙකකට ගෙවිය යුතු වසර තුනකට වඩා පැරණි ණය ශේෂය | 32,319,927 | ශේෂ සඳහා සනාථන ලබා ගෙන නොතිබුණි. | ලංකා සෙරමික් ලිමිටඩ් -( රු 26,226,152.00 )ආයතනය ලංකා පිඟන් සංස්ථාව සමඟ එකට සිටි ආයතනයක් වන අතර, සංස්ථාව විසින් ඉටු කරන ලද සේවා වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු ණයගැති මුදල් හිලව් කොට ඉතිරි මුදල පමණක් ගෙවීමට ඇති ලෙස දක්වා ඇත. 1990 ට පෙර සිට එන පැරණි ශේෂයක් වන අතර,එම තොරතුරු කිසිවක් නොමැති බවත් ලංකා ඛනිජතෙල් සංස්ථාවට ගෙවිය යුතු රු.6,093,775 ශේෂයද පැරණි ණය ශේෂයක් වන අතර, අදාල තොරතුරු නොමැත. | ණය ශේෂ ගෙවා පියවීමටත් හඳුනානොගත් වටිනාකම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමටත් ක්‍රියා කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් හා තැන්පතු වටිනාකම රු.12,308,494 ක් වූ අතර, එම වටිනාකම තුල ඇතුලත් රු.5,000,000 ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් 2012 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂයක් හා රු.1,221,666ක් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂයක්ද විය. | මෙවැනි දෝෂ ඉදිරියේදි අවම කිරිම පිණිස කටයුතු සම්පාදනය කරන බව. | ශේෂ සනාථන ලබා ගෙන අදාල අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට පැවත එන ලංකා ඛනිජ වැලි සමාගමට ගෙවිය යුතු රු.387,275,583ක් වූ මුදල හා වසර ගණනාවක සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු වර්ග 6ක් සඳහා ගෙවිය යුතු එකතුව රු.121,768,339 ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ මුල්‍ය තත්වය සලකා බලා,අප කම්හල් සුදුසු ආයෝජකයන්ට බදු දිමෙන් පසු ලැබෙන ආදායමෙන් මෙම ගෙවීම් පියවීම් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු මුදල් පියවීමට කටයුතු කළ යුතු අතර අදාල නිරවුල් කිරීම් කඩිනමින් සිදු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2004 වර්ෂයේ සිට 2019 දක්වා වූ කාලයට අදාළ රු.1,993,009 ක විගණන ගාස්තු නිරවුල් කර නොතිබුණි. | ආයතනයේ මුල්‍යතත්වය යහපත් වූ විට ඉදිරියේදි කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මු.රෙ.770 (4) (ඉ) හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි I කොටසෙහි 13.2 ඡේදය | සංස්ථාවේ කම්හල් වෙත අනුයුක්ත කර තිබූ වාහන 15ක් අපහරණය කළ යුතු බවට හා තවත් වාහන 8 ක් ධාවන තත්ත්වයේ නොමැති බවට හඳුනාගෙන තිබුණද, රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීමට අදාල මාර්ගෝපදේශ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාවන තත්වයේ නොමැති වාහන අපහරණය කිරිම සඳහා අවශ්‍ය තොරතුරු රේඛිය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, එයට පිළිතුරක් මේ වන තෙක් ලැබී නොමැති බැවින් නැවත මේ සම්බන්ධයෙන් රේඛිය අමාත්‍යාංශයට දන්වා යැවිමට කටයුතු කරන බව. | අපහරණය කිරීම් සිදු කොට එම කාර්යය අවසන් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය | සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ භාණ්ඩ සහ සේවා සඳහා ඇස්තමේන්තු වියදම, ප්‍රසම්පාදන ක්‍රමය, ප්‍රසම්පාදනය ආරම්භ කරන හා අවසන් කරන දිනය,ඇතුලත් කර නොතිබුණි. විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට නොතිබුණි. | 2023 වසරේ සිට සකස් කරන බව | අදාළ වර්ෂය ආරම්භයට පෙර සැලසුම් සකස් කර ඒ සඳහා අදාල අනුමැතිය ලබා ගත යුතු අතරම අදාල යාවත්කාලීන කිරීම් නිතිපතා සිදු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,778,945 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 5,054,619 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.724,326ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් ආදායමෙහි සිදු වූ වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම නිෂ්පාදනය වැඩිකිරීම, නිෂ්පාදන වියදම ඇතුලු සමස්ථ වියදම අඩුකිරීම, විකුණුම් පරිමාව හා වෙළඳ කොටස වැඩි කිරීම ආදි වශයෙන් ඉලක්ක 10ක් සපුරා ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ඇතුලත් කරමින් සකස් කර තිබුණ ද ඊට අදාළ අයවැයගත ප්‍රතිපාදන දක්වා නොතිබුණ අතර කාර්යසාධනය මැනීම සඳහා වූ ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන ප්‍රගතිය ඇගයීම් කර නොතිබුණි. | ප්‍රමාණාත්මක පරිදි ගිණුම්හි අනාවරණය කිරිම සිදු කිරිමට කටයුතු කරන බව. | ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිමේදි වාර්ෂිකව ළඟා කර ගත හැකි ඉලක්ක අනුව සැලැස්ම සකස් කළ යුතු අතරම කාර්යසාධනය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන මාසිකව ප්‍රගතිය මැනීම සිදු කළ යුතුය. |
| (ආ) | කම්හල් දෙකක පවතින පිරිවැය රු.1,595,537 ක වාහන සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | මෙම වත්කම් සමික්ෂණ ලේඛනය අනුව පරික්ෂා කර තොරතුරු ගලපා ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ තත්‍ය නිෂ්පාදනය ඒකක 1,714,289 ක් වූ අතර 2021 වර්ෂයේ නිෂ්පාදන ඒකක 1,746,887 ක් විය. ඒ අනුව නිෂ්පාදනයේ අඩුවීම ඒකක 32,598 ක් එනම් සියයට 2 ක් විය. සංස්ථාවේ එක් අරමුණක් ලෙස නිෂ්පාදනය සියයට 5 කින් ඉහළ නැංවීම දක්වා තිබුණද එම අරමුණ ඉටු වී නොතිබුණි. | සංස්ථාවේ අරමුණ වුයේ නිෂ්පාදනය සියයට 5කින් ඉහල දැමීමට වුවත්,2022 වර්ෂයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පසු බෑම මත උළු තොග වැඩිවීම හේතුව මත නිෂ්පාදනය සීමා කිරීමට සිදු වූ බව. | සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිෂ්පාදන කටයුතු සිදු නොවන කම්හල් 07 පිහිටි ඉඩම් ගොඩනැගිලි ඇතුලු වත්කම් නිෂ්කාර්යව පවතින අතර කම්හල් පවත්වාගෙන යාම වෙනුවෙන් වාර්ෂිකව නිෂ්පාදන පිරිවැය හා පරිපාලන වියදම් වශයෙන් රු.මිලියන 10ක් පමණ වැය කිරීමට සිදුවී තිබුණි. | බංගදෙනිය කම්හල හැර අනෙකුත් කම්හල්වල නිෂ්පාදනය නොවුවද තොග වී ඇති භාණ්ඩ අලෙවි කිරීම සඳහා සීමිත සේවක සංඛ්‍යාවක් සේවය කරන අතර, මෙම කම්හල්වල අයිතිය ලංකා පිඟන් සංස්ථාව නමින් මෙතෙක් පැවරී නොමැති බැවින්, දැනට ඉල්ලුම් කර ඇති පරිදි ඉඩම් අමාත්‍යාංශයෙන් අයිතිය ලැබු පසු සුදුසු ආයෝජකයන් වෙත බදු දීමට බලාපොරොත්තු වන බව. | සියළු ඉඩම්වල හිමිකාරිත්වය ලිඛිතව පවරා ගැනීමට කටයුතු කල යුතු අතර සංස්ථාව සතු වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නිෂ්පාදන කටයුතු සිදුකරන එරගම හා මහියංගනය කම්හල් සතු අක්කර 325 ක් වූ භූමියෙන් අක්කර 50ක පමණ කුඹුරු ඉඩම බාහිර පාර්ශවයකට බදු දී තිබුණ ද, කම්හල් භූමිය හැර ඉතිරි වූ ඉඩම් ඵලදායී ආයෝජනයට යොදාගෙන නොතිබුණි. තවද එරගම කුඹුරු ඉඩම් වලින් අක්කර 3 ½ ක් පෞද්ගලික අයකු අල්ලා ගැනීම හා මහියංගන කම්හල් භූමියේ 2015 සිට අනවසර පදිංචිකරුවන් 125ක් පමණ ඇති බව නිරීක්ෂණය විය. | එරගම කම්හලේ කුඹුරු අක්කර 50 ක් බදු දී ආදායම් ලබන අතර, කම්හලේ අනෙකුත් ඉඩම් වල මැටි ලබාගැනීම සඳහා යොදාගන්නා ඉඩම් වන අතර, ලඳු කැලෑ වී ඇති කොටස්ද කුඹුරු මට්ටමට සකස් කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබන බවත්, පෞද්ගලික අය අල්ලාගෙන ඇති අක්කර 3.5 ක කොටසට නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින් ඒ සඳහා නඩු පවරා තිබෙන අතර අදාල නඩුව මේ වනවිට විභාග වෙමින් පවතින බව සහ මහියංගන කම්හලේ අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම් 2015 ට පෙර අල්ලාගත් ඉඩම් වන අතර, මෙම ඉඩම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත්තද ප්‍රාදේශිය දේශපාලන | සංස්ථාව සතු දේපළ වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

අතපෙවීම් නිසා පවරා ගැනිමට නොහැකි වී ඇති බවත් ,එම කොටස් යලි පවරා ගැනීම ක්‍රමවේදයන් නීතිපති දෙපාර්තමේන්තුවේද උපදෙස් ලබාගෙන සිදු කිරීමට කටයුතු කරනු ලබන බව.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අයවැය ලේඛනය අනුව ආදායම්,වියදම හා තත්‍ය ආදායම,වියදම අතර සියයට 26 ක සිට සියයට 338 දක්වා ප්‍රමාණාත්මක විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | මෙවැනි දෝෂ ඉදිරියේදී අවම කිරිම පිණිස කටයුතු සම්පාදනය කරන බව. | අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |